*Vidyodaya J. Arts, Sci., Lett. Vol. I No. I pp. 58-62 January 1968*

# මුවදෙව් දාවේ කර්තෘත්වය

ශ්‍රී ලංකා විද්‍යොදය විශ්වවිද්‍යාලයයේ සිංහල අධ්‍යයනාංශයේ
**විනී විතාරණ**
විසිනි

පොලොන්නරු–දඹදෙණි සමයට අයත් ගී කාව්‍ය අතුරින් රචිත කාලය හෝ කර්තෘ හෝ පිළිබඳ ව සුළු ම හෝඩුවාවක් වත් නොදරන්නේ මුවදෙව් දාව ය.[1] එහෙත් එය පොලොන්නරු සමයේ පබඳන ලද ග්‍රන්ථයක් වශයෙන් සැලැකීමට උපකාර වන සාධකයක් නම් භාෂා ලක්ෂණය යි. කල් නියම සේ දත හැකි සෙසු ගී පොත්වල භාෂාව හා එය බෙහෙවින් සම ය. තව ද, 13 වැනි සියවසේ දඹදෙණි කල්හි දී රචිත සිදත් සඟරාවේ මාත්‍රා හානිය සහ විධි ක්‍රියාව පිළිබඳ නිදසුන් සේ මුවදෙව් ද ගී පාද දක්වා ඇති අතර ම,[2] එ කල්හි ම රචිත සේ සලකනු ලබන එළු සඳැස් ලකුණේ ගජගාමී විරිතට නිදසුන් සේ මුවදෙව් ද මුල් ගීය දක්වා තිබේ.[3] එ නිසා එම රජ සමය (1220–93) මුවදෙව් දාවේ මෑත සීමාව සේ ගැනුම යුක්තිසහගත ය.

තව ද මෙම තුන් ගී කව් ගැන සලකත් ම, සම්පූර්ණත්වය අනුව මුල් තැන කව්සිළුමිණටත්, දෙවැනි තැන සස දාවටත්, තෙ වැනි තැන මුවදෙව් දාවටත් ලැබෙන බව දක්වන කුමාරතුංග මහතා 'පළමු පළමු කොටැ කරන ලද ග්‍රන්ථයනට වඩා පසු පසු කොටැ කරන ලද ග්‍රන්ථයන් සම්පූර්ණ වීම ධර්මතා' සේ ගෙන මුවදෙව් දාව ඒ අතරින් මුලින් ම කරන ලද බව සිතිය යුතු සේ දක්වයි.[4] ඒ අනුව ලීලාවතී රැජන කල්හි (1197–1200) කරන ලද සසදාවට කලින් බිහි වුණා විය යුතු යි, මුවදෙව් දාව.

එහෙත්, මුවදෙව් ද සහ සස ද යන දෙ පොත්හි එන මෙත් වැනුම් අතර සමකමක් දකින එ තුමා මුවදෙව් ද කරු අනුන් ගේ අරුත් පැහැර ගන්නා නිසාත්, සස ද කරු අලුත් අරුත් නිපදවන නිසාත්, මුවදෙව් ද කරු සස දාවෙන් අදහස් ලබා ඇතැ යි ද එ නිසා එයින් වඩා පැරැණි විය යුත්තේ සස දාව විය යුතු යැ'යි ද පසු ව නිගමනය කෙළේ ය.[5] එ හෙත්, මේ දෙ තැන්හි ම වැනුම් මහ එක්බඳු වුවෙ ද, එකෙක අරුත් අනෙක පැහැර ගත් බවක් නො පාන බව කුමාරතුංග මහතා නොදුටුවා සේ යි. තව ද, සස දාව වඩා ප්‍රතිභා ලක්ෂණ දරන්නේ නමුදු එහි කවියා අනුන් පැවැසූ අදහසක් නොගන්නා තරමේ ම ස්වාධීනයෙක් නො වී ය.[6] එ නිසා මේ නිගමනය මුල් නිගමනය තරම් සරු නැති බව පෙනෙයි.

මෙසේ, මුවදෙව් දාවේ කාලය පිළිබඳ ව යම් තරමේ වත් ස්ථිර නිගමනයකට බැසීමට පිළිවන්කමක් ඇතත්, එහි කර්තෘ හැඳින ගැනීමේ ලා නම් එම ග්‍රන්ථය ම හෝ, සමකාලීන නොහොත් පසු කාලීන සිංහල ග්‍රන්ථයක් හෝ කිසිදු පිටුවහලක් නො දෙයි.

---

1. ලීලාවතී රැජන දුන් අනුග්‍රහය සස දාවේ සඳහනි. කව් සිළුමිණේ කාව්‍යනාමගර්භ චක්‍රය පවතින අතර ම, කවියා ගේ පරපුර ද සඳහනි. මෙ නිසා, මේ ග්‍රන්ථ දෙකෙහි ම කාලය, පුළුල් සීමා ඇතුළත වුව ද, නිසැක ය.
2. 'නුවණ නි සයුරා' සහ 'අව:—ගුණෙකැත් නම් මෙහි බජව්'; මේ මුවදෙව් ද 1 සහ 5 යන ගීවලින් පාද ය.
3. නුවණ නි සයුරා—විනෝ කුමුදු නිසයුරා
   කෙලෙස් තුසර දිවයුරා—බව දුක් ලැව් අග'යුරා (1)
4. මුවදෙව් ද විවරණය—කුමාරතුංග (2495): ප්‍රථම සංස්කරණ යේ ප්‍රස්තාවනාව' 2
5. එම: තෘතීය සංස්කරණයේ ප්‍රස්තාවනාව: 11 (මෙය ලියන ලද්දේ ප්‍රථම සංස්කරණයෙන් 16 වසරකට පසු ව ය.)
6. කුමාරතුංග සංස්කරණයේ ම 85, 129 සහ 171 ආදී ගී වලට සැපැයුණු විවරණ බ.

එහෙත් පොලොන්නරු කල පිළිබඳ ව මහාවංසයේ පැවැසෙන ඇතැම් පුවත් ආශ්‍රයෙන් මේ පිළිබඳව යම් තරමින් වත් පිළිගත හැකි නිගමනවලට බැසීම අපහසු ම නො වෙයි.

පොලොන්නරු සමය (1055–1234) ඇරැඹූ පළමු විජයබා රජු ගේ අණසක පැවැතුණු පනස්–පස් වසර තුළ සාහිත්‍යකරණය සඳහා සුදුසු පරිසරයක් පැවැත්තේ ය. ලෝක සාසන සේවයෙහි යෙදුණ ඒ රජු කල්හි එහි ලා අත්‍යවශ්‍ය සාමය නො නැසී රැකිණි.[7] එ ද රටෙහි බොහෝ කවියෝ වූ හ. ඔවුන් අතරෙහි ඉහළින් ම සිටියේ රජ තුමා ම ය.[8] ඒ සමග ම රාජාමාත්‍යාදීන් ගේ පුත්තු ද කාව්‍යකරණයෙහි යෙදුණ හ.[9] මේ පුත් කුමරුවන් ගේ සාහිත්‍ය සේවාව විජයබා සමයෙන් පසු ව ද, වඩා පරිණත තත්ත්වයෙන්, ඇති වන්නට ඉඩ තිබුණු බව විශේෂයෙන් මෙනෙහි කරනු වටී.

මේ අනුව, විජයබා කල්හි දී (1055–1110) මුවදෙව් ද කව බිහි වන්නට ඇතැයි සිතනු හැකි ය. එසේ නො වුණු බව සිතීමට තරම් වන සාධකයක් නම් නැත්තේ ය. එහි කර්තෘ රජු ම විය හැකි ය; නො එසේ නම්, සමකාලීන ව සිටි (නම නො සඳහන් කළ) වෙන අන් කවියකු විය හැකි යි.

එ බඳු සාමවත් සිරිබර කලෙක දී බිහි වූයේ මුවදෙව් දව පමණක් ම ද වනු නො හැකි යි. යම් ග්‍රන්ථ රැසක් බිහි වුණා නම්, එයින් අද ඉතිරි ව ඇත්තේ මුවදෙව් දව පමණක් බව යි, නිගමනය විය යුත්තේ.[10]

මහ විජයබා කල්හි පොදුවේ සාහිත්‍ය ග්‍රන්ථ බිහි වුණු බව මෙසේ පිළිගත හැකි අතර, මුවදෙව් දව පැබැඳුණු බවට තුඩු දෙන විශේෂ සාධක පවතින්නේ එ රජු ඇවැමෙන් තෙසාළිස් වසරෙකින් පසු පැමිණි කල හා සම්බන්ධ ව ය. එද ක්‍රි.ව. 1153 දී—විජයබා මුනුබුරු දෙ වැනි ගජබා රජ එක්විසි වසරක් රජකම් කොට සිහසුන අත් හැර සිටියේ ය.[11]

මේ අවස්ථාවෙහි දී එ තුමා මහල්ලකු ව සිටි බව පැවැසෙන හෙයින්,[11] එ තුමා කිරුළු පළන් කල්හි දී (1132) මැදි වියෙහි යම් අවස්ථාවෙක සිටින්නට ඇති. එයට දෙ–විසි වසරක් පෙර මහ විජයබා රජු පරලෝ සුව සොයත් ම (1110) එ තුමා තරුණ වියෙහි පසු වෙමින්, නොහොත් තරුණ විය ඉක්මවමින් මැදි වියට පා තබමින් සිටින්නට ඇති.

මෙම ගජබා කුමරා ස්වභාවයෙන් ම රජකමට සුදුස්සකු සේ සිය පියා විසින් සලකනු ලැබුයේ නැති. ජයග්‍රහණ අත් කැර ගැනුමේ සහ ලැබූ දැ රැක ගැන්මේ සවියක් ඔහුට නැති බව දෙ වැනි විකුම්බා (පිය) රජ තුමා සැලැකී ය; ඒ අතර ම, අන් බිසොවක ගෙන් එ තුමා ලත් මිහිඳු කුමරා සූරභාවයෙන් යුක්ත වුවෙ ද, මව් පසින් පහත් නිසා ඔහු ද රජකමට නිසි නැති බව සැලැකී ය. ඒ නිසා යි, නෑකමින් බෑනා වූ ද, වීර ලක්ෂණයෙන් යුක්ත ව උපන්නා වූ ද (මහ) පැරැකුම් කුමරා හද වඩා ගැනුමේ රිසිය එ තුමා පළ කෙළේ[11].

ගජබා කුමරා පිළිබඳ ව මහා වංසයේ පැවැසෙන පාඨය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු වටී. එම පාඨය නම්:

---

7. මහාවංසය, (මවං.) LX.
8. 5-14 යන සියවස් කල්හි දී ටීකාර්ථ කථා, ධර්ම ප්‍රබන්ධ, ධර්මානුගත ශ්ලෝක ප්‍රබන්ධ සහ ධර්ම ව්‍යාඛ්‍යාන ආදිය බිහි කළ ගිහි පැවිදි පඬුවන් ගේ නම් නිකාය සංග්‍රහයේ (කුමාරතුංග සංස්කරණය: 23-4) එයි. මෙයින් 'ධර්මානුගත ශ්ලෝක ප්‍රබන්ධ අතරෙහි හෙළ ගී පොත් ද පවතින්නට ඇතැ'යි සිතනු නිවරද සේ පෙනේ. සියවස් නවයක් කෙටි කාලයක් නුවුවෙ ද, මෙහි දැක්වෙන පිරිසෙන් ඇතැමකු වත් සිරිබර විජයබා කල්හි දී විසූ සේ සැලැකුම ද නිවරද සේ පෙනේ.
9. මවං. LX. 75-6, 79.
10. සිදත් සඟරාවේ ද එළු සඳැස් ලකුණේ ද නිදසුන් සේ දැක්වෙන පාඨවල භාෂාව බෙහෙවින් ම පොලොන්නරු ලක්ෂණ දරයි. මේවායින් ඇතැමක් වත් මේ පොත්වලින් ගත්තේ වන.
11. මවං. XLII. 52-62.

'අලද්ධං ලභිතුං ලාභං ලද්ධං ච පරිරක්ඛිතුං සබ්බතා න සමත්ථො . . .' [12]

යනු යි. එ තුමා අනුවණයකු බව හෝ ශාරීරික දුබලතාවෙකින් පෙළෙන්නකු බව හෝ එයින් ප්‍රකාශිත නැති. මෙයින් පැවැසෙන්නේ රාජ්‍ය භාරය දරන්නකුට අත්‍යවශ්‍ය ලෞකික ලක්ෂණ — නොලබන දෑය පවා ලබා ගැනුමේ අභිප්‍රාය, ජයග්‍රහණයේ රිසිය, ලබන දෑ ආරක්ෂා කැර ගැනුමේ සවිය — එ තුමාට උපතින් ම නොපිහිටා තිබුණු බව යි. එ තුමා පොතපත ඇසුරු කාරියෙහි යෙදී සිටින්නට ඇති; ආගමික කටයුත්තෙහි නිරත වන්නට ඇති; ලාභය සහ ලෝභය මත රැඳුණු රාජ්‍යභාරය පිළිගැනුම හුදු ලෞකිකයනට සුදුසු කටයුත්තක් සේ සලකා එය නොරුස්සන්නට ඇති, එ තුමා.

සිය මුත් මහ විජයබා රජු කල්හි කාව්‍යකරණයෙහි නියෙදුණු රාජාමාත්‍යාදීන් ගේ පුතුන් අතරෙහි තරුණ ගජබා කුමරා ද සිටින්නට ඇතැයි කවුරු සැක කෙරෙත් ද? හස්ත්‍යාරෝහණය, අශ්වාරෝහණය, ධනුශ්ශිල්පය, රාජෝපාය ආදිය නො හදරා ව්‍යාකරණ, ඡන්දෙලංකාර, පුරාණ ආදියත් බුද්ධ ධර්මයත් හදරමින් ඒ අනුව සිය සිත පාලනය කළ කුමරකු ගැන සිය පිය රජු සිතූ දෑ යුක්තිසහගත නොවන්නේ නො වේ.

එහෙත් සිය පෞද්ගලික ස්වභාව රජකම හා කොතරම් නො ගැලැපුණේ වුව ද, එ තුමා රජ වූයේ ම ය. ඔහු රජ වත් ම වේලක්කාරයෝ කැරළි ගැසූ හ; සතුරෝ පහර දෙන්නට වත් හ. එහෙත්, එ තුමා දුබලයකු සේ නො හැසිරුණේ ය. කැරල්ල සන්සිඳියේ ය, සටන්වලට මුහුණ දුන්නේ ය, දිනුවේ ය, නො දිනුවේ ය.[13] රජකු ගෙන් ඉටු විය යුතු දෑ හැකි පරිද්දෙන් එ රජ ද එදා ඉටු කෙළේ ය. ඔහු රජකමට නුසුදුස්සකු සේ සිය පියා එදා සිතුවේ වුව ද, ඒ අදහස තහවුරු වන පරිදි ගජබා රජු අතින් විශේෂ ප්‍රමාදදෝෂාදිය සිදු වුණු බවෙක් නො පෙනේ. පිය රජු ගේ එම සිතුවිල්ලට හේතු වූයේ සිය පුත් කුමරා බාලයේ සිට ම පොතපත ඇසුරු කරමින් දැමිවු, තැන්පත් ජීවිතයකට නැඹුරු වූ නිසා ම බව මෙයිනුදු හෙළි වෙයි.

කූටෝපායෙන් තොර වූ එ තුමා හටන් බිමට පත්තේ වුව ද, හැකි තැන සාමයත්, මිතුරුදමත් පැතී ය.[14] ක්‍රමයෙන් වයස් ගත වුණු එ තුමා, 1153 දී, (මහ) පැරකුම් කුමරා හා සටනින් පැරැද, වට ලනු ලැබ සිටි අවස්ථාවේ දී මහ සඟුන් ගෙන් පිහිට අයැද සිටියේ ය. ඉක්බිති ව, 'පැරකුම් රජුට රජ රට පවරා දෙමි' යි මැදිරිගිරි වෙහෙර බිමෙහි සෙල්ලිපියක් පිහිටුවා, සාමවත් ජීවිතයකට පා තැබූ එ තුමා ගංතලාවට ගොස් රැඳී සිටියේ ය. ඔහු මළේ එ තැන දී ය.[15]

විහාර භූමියෙක ආගමික වටිනාකමින් තොර දේශපාලනමය සෙල්ලිපියක් පිහිටුවීම සාමාන්‍ය කරුණෙක් නො වේ. එ තුමා සඟුන් ගේ ඇසුර ගරු කළ බවත්, ආගමික ස්ථානයකට ඉමහත් හරසර දැක්වූ බවත් එයින් වැටැහේ.

මහලු වියට පත් මේ ගජබා (රජ) තුමා එදා සිය දිවියේ නිදහස් සැහැල්ලු අවධියකට පා තැබුවේ වන. ඔහුට දරුවෝ නො සිටිය හ. (සිටියෝ නම්, ඔවුන් එ තුමාට බරක් නොවන වියෙහි සිටියා සැක රහිත ය.)[16] රාජ්‍යභාරය ද අත්හළෙන්, ආගමික කටයුත්තෙහි යෙදීමේ සහජ ගතිය අනුව හැසිරීමේ මහඟු අවස්ථාව එ තුමා වෙත එළැඹියේ එ කල ය. ඒ මතු ද, තමා කුමර කල්හි දී ප්‍රගුණ කළ කාව්‍ය ශිල්පයෙහි යළි සිත යෙදුමට ද එ තුමාට එදා අවස්ථාව එළැඹියේ යැයි සිතනු හැකි.

---

12. මවං. XLII. 58.
13. මවං. LXIII–LXXI.
14. මවං. LXIII. 28, LXVI. 113, LXX. 108-10, 273, 329.
15. මවං. LXXI. 1-5.
16. මවං. LXX 333; දෙවැනි විජයබා රජු මෙ තුමා ගේ පුත් බව සැලැකෙතත්, ඒ බව කවර ඉතිහාස ග්‍රන්ථයෙක වත් සඳහන් නැති. ගෛගර් තුමා ගේ චූලවංස පරිවර්තනයේ 125 වැනි පිටුවේ පළමු පාසටහන බ.

මෙ නිසා ගජබා (රජ) තුමා මේ කල්හි දී යම් සාහිත්‍ය ග්‍රන්ථයක් — ආගමික, පද්‍යමය ග්‍රන්ථයක් — කෙළේ යැයි සිතනු අසීරු නො වේ. එහෙත් එය මුවදෙව් දව ම යැයි සැකයක් ඇති වීමට තරම් සාධක ඇද්දැ'යි දැන් පරීක්ෂා කළ යුතු ය.

මුවදෙව් ද කතා වස්තුව කාව්‍ය ප්‍රබන්ධයක් සඳහා ප්‍රමාණවත් යැයි කියනු උගහට ය. ජාතක කථා අතරෙහි ම වඩා උචිත වස්තු කො තරම් පවතී ද? එහෙත්, අඩුලුහුඩු කමින් යුත් වූ එම පුවත යම් කවියකු සිය ග්‍රන්ථය සඳහා තෝරා ගන්නවා නම්, එය යම් විශේෂ කරුණක් නිසා ම විය යුතු ය.

මහලු බවට පත් වුණු මේ ගජබා (රජ) තුමා කෙරෙහි විශේෂ කරුණක් පැවැත්තේ ම ය. එ තුමා රජකම් නො කැර ම සිය ජීවිතයෙන් සෑහෙන ප්‍රමාණයක් ගත කෙළේ ය. ඉක්බිති ව, රජකමට පත් ව සටන් කෙළේ ය. ස්වභාවයෙන් ම දැමිටු වූ එ තුමා ඒ සියල්ලෙහි නිෂ්ඵල බව දුටුයේ තරුණ කුමරකුට සිය රජය පවරා දී, මහ සඟුන් ඇසුරෙහි ද වෙහෙර බිම් පරිසරයෙහි ද විවේක සුවයෙන් යුත් දැහැමි දිවියක් ගත කරන්නට වන්නේ ය.

මෙ තුමා ගේ ජීවිතයේ ප්‍රධාන අවස්ථා මඛාදේව රජු ගේ ජීවිතයේ ප්‍රධාන අවස්ථා හා කො තරම් සම ද? ආගමික ජීවිතයක් ගත කළ එ තුමා ජාතක පොත කියවත් ම මේ සමකම ඔහුට දිනෙන් දින වැටැහී ගොස් එය කවකට හැඟීමේ දැඩි පෙළැඹීමක් ඔහු ගේ හදවතයෙහි පැන නැගෙන්නට ඇති.

කුමරකු වශයෙන් ද, පසු ව රජු වශයෙන් ද එ තුමා යම් සැප වින්දේ වුව ද, එයින් කිසිදු පලයක් නැති බව එ තුමාට අවබෝධ වීමේ පිළිරූව වශයෙන් දෝ මුවදෙව් දවෙහි

'පරදී බෙහෙවින් බලත
සැපත්හි ලගනා ලෙව්'[17]

යනු පැවැසී ය. එ තුමා කො තරම් බලවත් ව සිටියේ ද, හතුරන් වැඩි වූ අවස්ථාවෙහි — පෙර සිය සහායට සිටි නගරගිරි ගෝකන්න[18] වැනි ගිතවත් සෙනෙවියන් නොමැති වූ අවස්ථාවෙහි — පරාජය වූයේ ය. පොලොන්නරුව කරා ගමන් ගත් (මහ) පැරකුම් කුමරාට වරෙක දී හසුන් යවන්නේ, 'අප දෙ දෙනා එක්සත් වූ කල මහ හුළඟෙහි සහාය ලත් ගින්නේ ප්‍රතාපය සේ මා ගේ මහිමය වඩී'[19]යි සඳහන් කළ නමුත් ඒ පැතු සහාය ද නියම සේ නො ලැබිණි. මුවදෙව් දවෙහි, අනංගයා පුන් සඳට විරුද්ධ ව දුනු ගැනුම පිළිබඳ ව

'දිය නැත් මැයි දියැ–සහතෙදනට ද නොසහා'[20]

යනුවෙන් එ තුමා තැවෙන්නේ මේ පෞද්ගලික අත්දැකීම සිය හදවත කම්පා කළ නිසා ම විය යුතු.

ලංකා ඉතිහාසයේ මෙ අවධිය විස්තර කරන මහාවංසය මහ පැරකුම් වීර චරිතය නිර්මාණය කරන්නේ, සෙස්සන් ගැන පුවත් සැපැයීමෙන් වැළැකී සිටියි. එ නිසා මෙහි දැක්වෙන නිගමන වලට සෘජු මූලාශ්‍ර පිටු බලයක් එම ග්‍රන්ථයෙන් හෝ, එහි ඇසුර පදනම සේ ගත් පසුකාලීන ඓතිහාසික ග්‍රන්ථවලින් හෝ නො ලැබෙන බව මෙහි ලා පිළිගත යුත්තේ යි.

---

17. 101 ගීය 18. මවං. LXIII. 34, LXVI. 35, LXX. 69, 79 ආදිය

19. මවං. LXVI. 120

20. 77 ගීය; 'ලොවෙහි තෙද ඇතියනට ද, සහායට යමකු නැති කල, ජය නැත්තේ ම ය' යනු අදහස යි.

## මුවදෙව් දාවේ කර්තෘත්වය

ගජබා (රජ) තුමා ක්‍රි.ව. 1153 දී ගංතලාවේ ගෙවූ ඒ අවසන් කාලය ඉතා කෙටි සේ පෙනෙයි.[21] මුවදෙව් දාව පබඳින්නට ඇත්තේ එම කල්හි දී යැයි සිතනු හැකි යි. ගී 164 කින් යුත් ඛණ්ඩ කාව්‍ය ග්‍රන්ථයක් කැරුමට දිගු කලක් අවශ්‍ය නො වේ.

පොලොන්නරු කල්හි දී විසූ තවත් කවියකු වශයෙන් සඳහන් වන්නේ ක්‍රි.ව. 1146 සිට 1187 දක්වා රජ කළ දෙ වැනි විජයබා රජ යි. එ තුමා කවීශ්වර වූ බව ද, ධීර වූ බව ද[22] විනා අන් කිසිදු පුවතෙක් මහා වංශයේ හෝ වෙන අන් තැනෙක හෝ සඳහන් වී නැත්තේ ය. මුවදෙව් දාව කෙළේ එ තුමා යැයි යමකු කිව හොත් එයට පක්ෂ ව සේ ම විපක්ෂ ව ද කිසි ශාක්ෂියක් ඉදිරිපත් කැරුම උගහට ය.

මෙසේ, පොලොන්නරු රජ සමය පිළිබඳ ව පවතින සාධක අනුව මුවදෙව් දා කිවියා සේ ඉහළින් ම අනුමාන කළ හැක්කේ දෙ වැනි ගජබා රජ තුමා යි; ප්‍රබන්ධ කාලය ක්‍රි.ව. 1153 හා ඉතා සමීප සේ ගත හැකි වේ.

---

21. මවං. LXI. 3-5.
22. මවං. LXXX. 1; සොරත හිමියන් විසින් කව් සිළුමිණ කවියා සේ සැලැකෙන්නේ ද මෙ රජ ය: කව් සිළුමිණ—සොරත සංස්කරණය. 1946. 3-9.